රුහුණ විශ්වවිද්‍යාලය

ආර්ථිකවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - 2015/2016

දෙවන සමාසික අවසාන පරීක්ෂණය - 2017 අප්‍රේල්

**MAE 5201 - රාජ්‍ය අංශයේ ආර්ථික විද්‍යාව**

කාලය : පැය 03 යි.

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.

---

## I කොටස

01. භාණ්ඩ සැපයුම්කරුවකු මත ඒකක බද්දක් පනවන්නේයැයි සිතන්න. කොතරම් බදු ප්‍රමාණයක් සැපයුම්කරුවා විසින් දරණු ලබන්නේ ද? කොතරම් ප්‍රමාණයක් පාරිභෝගිකයා වෙත විතැන් කරන්නේ ද? යන්න තීරණය කරක සාධක පැහැදිළි කරන්න. ඔබගේ පිළිතුර පැහැදිළි කිරීම සඳහා ප්‍රස්ථාර සටහන් යොදා ගන්න.

(ලකුණු 15 යි)

02.

I. ආදායම් බදු ප්‍රතිපත්තිය ශ්‍රම වෙළඳපොල සහභාගීත්ව තීරණයට බලපාන්නේ කෙසේ ද? යන්න පැහැදිළි කරන්න. ඔබගේ පිළිතුර පැහැදිළි කිරීම සඳහා ප්‍රස්ථාර සටහන් යොදා ගන්න.

(ලකුණු 08 යි)

II. බදු මගින් ඉතුරුම් සහ ආයෝජන කෙරෙහි ඇති කරනු ලබන ආර්ථික ප්‍රතිවිපාක කවරේ ද?

(ලකුණු 07 යි)

03. ඕනෑම කොටස් තුනකට (03) විස්තරාත්මක සටහන් ලියන්න.

I. බදු පැහැර හැරීම් (Tax Evasion) සහ බදු මගහැරීම් (Tax Avoidance)
II. ශ්‍රී ලංකාවේ ලිහිල් කරන ලද ආර්ථික ප්‍රතිපත්තිය (Liberal Economic Policy) රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ
III. බදු ක්‍රමයක අපේක්ෂිත ගුණාංග
IV. ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදම් පියවා ගැනීමේ විවිධ මාර්ග සහ ඒවායේ මෑතකාලීන උපනතීන්
V. එකතු කළ අගය මත අයකරන බදු (Value Added Tax)

(ලකුණු 05x03=15 යි)

## II කොටස

04.

I. පොදුවේ වාසි පිරිවැය විශ්ලේෂණයට අනුව මුදුන් පමුණුවා ගැනීමට ප්‍රයත්න දරණ ශුද්ධ ප්‍රතිලාභ සාකච්ඡා කරන්න.

(ලකුණු 05 යි)

II. වැඩසටහන් හා ක්‍රියාකාරකම් ඇගයීමට යොදා ගත හැකි උපාය මාර්ග (ඇගයීමේ ක්‍රම) මොනවා ද?

(ලකුණු 05 යි)

III. රජය වාසි පිරිවැය විග්‍රහයේ මූලධර්ම යටිතල පහසුකම් සංවර්ධන යෝජනා ක්‍රම ඇගයීමට යොදා ගන්නේ ද?

(ලකුණු 05 යි)

05.

I. මූල්‍ය ප්‍රතිපත්තිය හා රජයේ අයවැය අතර සම්බන්ධතාවය පවතී ද? පැහැදිළි කරන්න.

(ලකුණු 05 යි)

II. මූල්‍ය ප්‍රතිපත්තිය තුළ රාජ්‍ය වියදම් න්‍යායයෙහි කාර්යය භාරය අගයන්න.

(ලකුණු 05 යි)

III. මධ්‍ය කලීන අයවැය රාමුව පදනම් කොට ශ්‍රී ලංකාවේ අයවැය ක්‍රියාවලිය සාකච්ඡා කරන්න.

06.

I. පහත සඳහන් වගුව භාවිත කරමින් ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථායීතාවය පැහැදිළි කරන්න.

(ලකුණු 05 යි)

සාර්ව ආර්ථික දර්ශකයේ විශේෂ ලක්ෂණ

| වර්ෂය | ඒක පුද්ගල ආදායම මැදි වසර | | මුලු මූල්‍ය පරතරය ආදයමේ % වශයෙන් | බාහිර ණය (රජයේ පමණක්) ඩොලර් වටිනාකමින් | බාහිර ණය සේවා අනුපාතය අපනයනයේ % වශයෙන් | ගෙවුම් ශේෂ ජංගම ගිණුමේ පරතරය ඩොලර් වටිනාකමින් |
|---|---|---|---|---|---|---|
| | ද.දේ.නි. ඩොලර් වටිනාකමින් | ණය ඩොලර් වටිනාකමින් | | | | |
| 2000 | 869 | 940 | 55.1 | 9,031 | 24.0 | 1,066 |
| 2005 | 1,242 | 1,222 | 41.8 | 11,354 | 14.1 | 650 |
| 2010 | 2,744 | 1,242 | 53.5 | 21,438 | 41.5 | 1,075 |
| 2012 | 3,351 | 3,060 | 45.8 | 37,098 | 74.8 | 3,982 |
| 2014 | 3,853 | 3,613 | 49.1 | 42,914 | 83.7 | 1,987 |
| 2015 | 3,924 | 3,888 | 56.8 | 44,794 | 118.1 | 2,008 |
| 2016 | 3,950 | 4,537 | 67.8 | 57,121 | 148.1 | 1,500 |

මූලය මහ බැංකු වාර්ෂික වාර්තා, ශ්‍රී ලංකා

II. වාසි පිරිවැය විශ්ලේෂණය පදනම් කොට ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති විවේචනාත්මකව අගයන්න.

(ලකුණු 05 යි)

III. ශ්‍රී ලංකවේ විදේශ ණය බර අඩු කිරීමට භාවිත කළ හැකි ප්‍රධාන ණය කළමණාකරණ උපාය මාර්ග මොනවා ද?

(ලකුණු 05 යි)

@@@@@@@